
<u>දුම්රිය බලපත්‍රය භාවිතයෙන් අන්තර්ජාලය ඔස්සේ දුම්රිය ආසන වෙන් කිරීමේ මාර්ගෝපදේශ</u>


මෙම ක්‍රමය භාවිතයෙන් දුම්රිය ආසන වෙන් කිරීමට සැරසෙන ඔබ දුම්රිය බලපත්‍ර භාවිත කිරීම පිළිබඳව ආයතන සංග්‍රහයේ ඇති සියළු විධිවිධාන මෙන් ම මේ සම්බන්ධව නිකුත් කර ඇති සියළු චක්‍රලේඛ සහ නියමයන් හා කොන්දේසි හොඳින් කියවා අවබෝධ කරගෙන සිටිය යුතු අතර ඒවාට අනුගතව කටයුතු කළ යුතුය. තවද ආසන වෙන් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන විට ඔබගේ ගමනට අදාළව නිකුත් කළ නිවැරදි වලංගු අඩුපාඩු රහිත දුම්රිය බලපත්‍රයක් ඔබ සතුව තිබිය යුතුය.

1. https://seatreservation.railway.gov.lk/mtktwebslr/ යන වෙබ් අඩවියට පිවිසෙන්න.

2. “Warrant User” ටැබය තෝරන්න.





3. ඔබ සතුව පවතින දුම්රිය බලපත්‍රයේ අඩංගු තොරතුරු නිවැරදිව ඇතුළත් කරන්න. (සැ.යු. - දුම්රිය බලපත්‍රයේ තොරතුරු නිසියාකාරව නිවැරදිව ඇතුළත් නොකිරීම තාවකාලික වෙන්කරවා ගැනීම අවලංගු වීමට හේතු විය හැකිය)




(ආදර්ශයක් පමණි)


4. ඔබේ දුරකථන අංකය ඇතුළත් කර “Verify” මත ක්ලික් කරන්න. එවිට පහත පරිදි කවුළුවක් විවෘත වනු අතර ඔබේ දුරකතන අංකයට ලැබෙන OTP අංකයක් ලැබේ. එය අදාළ කොටු වල නිසි පරිදි ඇතුළත් කර “Verify and Proceed” මත ක්ලික් කරන්න.





ඔබ නිවැරදිව OTP අංකය ඇතුළත් කළේ නම් පහත පරිදි නිල් පැහැ √ ලකුණක් දිස්වනු ඇත.





5. ගමන් ආරම්භ කරන හා ගමනාන්ත දුම්රිය ස්ථාන, ගමන් කරන දිනය සහ මඟීන් සංඛ්‍යාව ඇතුළත් කර “Search” මත ක්ලික් කරන්න. මෙහි දී ඔබ ඇතුළත් කළ යුත්තේ ඔබගේ සත්‍ය ගමනට අදාළ තොරතුරු මිස බලපත්‍රයේ සඳහන් තොරතුරු නොවේ. නමුත් පවතින රෙගුලාසි හා නීති රීති වලට අනුව බලපත්‍රයේ සඳහන් තොරතුරු වලට ගමනේ යෙදීම ගැළපිය යුතුය.





6. ඉන්පසු ඔබ ඇතුළත් කළ ගමන් තොරතුරු වලට ගැළපෙන දුම්රියන් සෙවුම් ප්‍රතිඵලයේ දිස්වනු ඇත. (සැ.යු. - ඔබගේ ගමන් විස්තර වලට ගැළපෙන දුම්රියන් තිබුණ ද ප්‍රමාණවත් ආසන ප්‍රමාණය නොමැති නම් ද සෙවුම් ප්‍රතිඵල වල එම දුම්රියන් දිස් නොවනු ඇත.)





7. ඔබට අවශ්‍ය දුම්රිය මත ක්ලික් කර ඉදිරියට යන්න.




8. ඔබට අවශ්‍ය ආසන පන්තිය තෝරන්න.





9. එවිට පහත කවුළුව විවෘත වේ.




එහි ඒ ඒ ස්ථානවල ඔබගේ තොරතුරු ඇතුළත් කර “Submit” මත ක්ලික් කරන්න. මෙහි දී දුම්රිය බලපත්‍ර හිමියා ගමන් නොකරන්නේ නම් ගමනට සහභාගී වන වෙනත් අයෙකුගේ (උදා: බිරිඳ)

තොරතුරු “Primary Passenger Details” ලෙස ලබා දෙන්න. ගමනට සහභාගී වන අනෙක් අයගේ තොරතුරු “Other Passenger info” ලෙස ලබා දෙන්න.

10. එවිට පහත වෙබ් පිටුව වෙත යොමු වේ.
එහි ඔබගේ ගමන් විස්තර ඇතුළත් සාරාංශයක් බැලීමට ද නියමයන් හා කොන්දේසි වලට එකඟ වන බවට √ සලකුණ යෙදීමට කොටුවක් ද සේවා ගාස්තුව ගෙවීම සඳහා ගෙවීම් ක්‍රමයක් තෝරා ගැනීමට අවස්ථාව ද ඔබට ලබා දේ. නියමයන් හා කොන්දේසි වලට එකඟ වී සේවා ගාස්තුව ගෙවීම සඳහා ගෙවීම් ක්‍රමයක් තෝරා තෝරා “Checkout” මත ක්ලික් කරන්න.




11. ඉන්පසු ඔබව මුදල් ගෙවීම හා සම්බන්ධ ක්‍රියාවලිය සඳහා IPG වෙබ් පිටුව වෙත යොමු කරනු ඇත.

12. සාර්ථකව මුදල් ගෙවීම හා සම්බන්ධ ක්‍රියාවලිය සම්පූර්ණ කළ පසු ඔබගේ තාවකාලික වෙන් කිරීමට අදාළ තොරතුරු ඔබට දිස්වන අතර එම තොරතුරු PDF ගොණුවක් ලෙස බාගත කර ගැනීමේ අවස්ථාව ද ඔබට ලැබෙනු ඇත. (සැ.යු. මෙය තාවකාලික වෙන් කිරීමක් වන අතර නියමිත කාල සීමාවට පෙර නිවැරදි දුම්රිය බලපත්‍රය වෙන් කිරීමේ පහසුකම සහිත දුම්රිය ස්ථානයකට ඉදිරිපත් කර වෙන් කිරීම ස්ථිර කර ගෙන ප්‍රවේශ පත්‍රය ලබා ගත යුතුය.